


**Sannasa**
244 Princes Hwy
Hallam VIC 3803 Australia

email - sannasanews@gmail.com
Tel 0432 391 922/ 0433 438 535
www.sannasa.com

**සංස්කරණය / Editors**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සහය සංස්කාරක /Asst Editor**
**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
අතුල උපසිරි කල්දෙමුල්ල
Athula Upasiri Kaldemulla

**සේයා රූ/ Photography**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න
Prasanna N Kurukularathne
විජිත කුමාර
Wijitha Kumara

**වෙළඳ දැන්වීම් / Advrertising**
S Jayasinghe
03 8707 4604 / 0402 025 516
sjturaus@optusnet.com.au

**Account Name - Sannasa Media**
Bank - Westpac
BSB Number - 033 341
Account Number - 590847

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
ලක්ෂ්මන් කොඩිතුවක්කු
වි ක ධර්මබන්ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සම්බන්ධීකරණය**

NSW
Lakshman Kodituwakku
Athula Upasiri Kaldemulla

QLD
Ananda Samarathunga
2 Santorini Place
Forrest Lake QLD 4078
07 3372 7958

ACT
Asoka Nimalasiri
0400 429 031

WA
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhist Vihara

**වැදගත්**

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා / ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කා රකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දක්වීමට අවසර ඇත




# කැළල මකා ගත හැක්කේ ජනපතිට ම ය.

**ජයතිලක කම්මැල්ලවීර**



අපේ ජනාධිපති තුමා ස්වාධීන කොමිසන් සභා සහ දූෂණ සහ අපරාධ සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වන ආයතනවලට බරපතල ලෙස චෝදනා කරමින් කළ කතාව විවේචනය කරන්නන් ඒ කතාව හරිහැටි තේරුම් නොගත් බව කියමින් එයින් ඇතිවූ පැල්ලම සෝදන්නට පාලකයන්ට ඇපිල්ලීම තම වෘත්තිය ලෙස තෝරා ගත් පිරිසක් ඉදිරිපත්ව සිටිනු අපි පසුගිය දිනවල දුටුවෙමු. එසේ ඉදිරිපත්වූ අය අතර වූ ඇමතිවරු කවුරුත් පාහේ නොයෙකුත් දූෂණ සම්බන්ධයෙන් චෝදනා ලැබ සිටින්නන් බව පෙනේ. දූෂණ සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වන ආයතන අඩපන කරන්නට අවස්ථාව බලමින් සිටි මේ පිරිසට ජනාධිපතිතුමාගේ කතාව ලොකු උත්තේජනයක් වී ඇත. කුමන පසුබිමක් යටතේ වුවද එතුමා කළ ඒ කතාවෙන් එතුමාගේ ප්‍රතිරූපයටත් රටටත් ඇතිවූ පැල්ලම සෝද ඉවත් කළහැක්කේ එතුමාටම මිස 'වෘත්තීය අපුල්ලන්ට' නම් නොවේ.

ස්වාධීන කොමිසන් සභා තම වගකීම හරිහැටි ඉටු නොකරන්නේ නම් ඒවා වෙනස් කරන්නට රටේ ජනාධිපතිවරයා හැටියට මැදිහත්වීම ගැටලුවක් නොවේ. නමුත් ජනාධිපතිවරයා ඒවා ප්‍රසිද්ධියේ විවේචනය කිරීමෙන් සිදුවිය හැකි හානිය කුමක්ද යන්න දැන් රටට හොඳින් පැහැදිලිය. ජනාධිපතිවරයාගේ කතාවෙන් වඩාත් සතුටට පත්වී සිටින්නේ රාජපක්ෂ පාලනය තුළ සිදුවී ඇති අපරාධ බොහොමයකට වගකිව යුත්තා ලෙස රටට පෙනෙන ගෝඨාභය රාජපක්ෂ සහ රාජපක්ෂ පවුලය. එෆ්සීඅයිඩිය සහ රහස් පොලීසිය සම්බන්ධයෙන් ප්‍රශ්න ඇතොත් ආරක්ෂක ඇමතිවරයා හැටියට අවශ්‍ය පියවර ගන්නට බලයක් ජනාධිපතිවරයාට ඇත්තේය. නමුත් මේවා දේශපාලන පලිගැනීම් සඳහා පිහිටුවාගෙන ඇති ඒවා යයි මහින්දවාදීන් දිනපතාම නගන චෝදනාව තහවුරු කෙරෙන අයුරු කතාකිරීමෙන් සිදු වන හානිය කල්තබා මැන බලන්නට නොහැකිවීම රටේ ම අභාග්‍යයකි.

'වෘත්තීය අපුල්ලන්නන්' කොතරම් උත්සාහ කළ ද පැල්ලම සෝදන්නට නොහැකි වන්නේ මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය වූ ජනාධිපතිවරයාගේ කතාව ඕනෑම මොහොතක නැවත බලන්නට හැකි වන පරිදි අන්තර්ජාලයේ ගබඩා වී ඇති බැවිනි. ඔවුන් කියන පරිදි ඒ කතාව හරි හැටි වටහා ගන්නට බැරිවූ කෙනෙකු වෙතොත් එවැන්නෙකුට නැවත නැවත අසා වටහා ගන්නට ද අවස්ථාව තිබේ. සත්‍ය වන්නේ කාගේ බලපෑමකට, කුමන හේතුවක් නිසා හෝ එතුමා තමාගේ ප්‍රතිරූපයටත් රටටත් හානිකර කතාවක් කළ බවය. එතුමා එවැනි තැනකට තල්ලු වන්නේ හේතු කාරනා ගණනාවක් නිසා යයි සමහරු කියති. එය ඇත්තක් ලෙස පිළිගත හැකිය. එය පිළිගනිමින් අප කළ යුත්තේ ඒ කාරණා මොනවාදැයි තේරුම් ගන්නට උත්සාහ කිරීමයි. ඒ කාරණා අතර අල්ලස් කොමිසම, මහබැංකු බැඳුම්කර වංචාව ගැන පරීක්ෂණ නොපැවැත්වීම ප්‍රධාන එක බවට මහින්දවාදීහු ඔසවා පෙන්වති. අර්ජුන මහේන්ද්‍රන්ට විරුද්ධව නිසි පරිදි පරීක්ෂණ නොපැවැත්වීම බරපතල වරදක් බවට සැකයක් නැත. එ සේ ම ඇවන්ගාඩ් ගැන පරීක්ෂණ කැලේ පැන්වීම ද බරපතල වරදකි. තැනින් තැන ඇති කෝටි ගණන් දේපළ තමන්ගේ නොවේ යයි

8 වන පිටට